## ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - 2016
-----------------------------------------------------

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් පහත දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම
---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000 – 1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 ආයතනය සංස්ථාගත කිරීම
-----------------------------

2005 අගෝස්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/ 0994 / 029 / 013 ට අනුව ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය විධිමත් ලෙස සංස්ථාගත කරන තෙක් මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ අනන්‍යතාවය මත තවදුරටත් පවත්වාගෙන යාමට ඉඩදිය යුතු යැයි තීරණය කර තිබුණි. එහෙත් එම තීරණය ලබාදී වර්ෂ 12 ක් ඉක්ම ගොස් ඇතත් එම කාල පරිච්ඡේදය තුළ ආයතනය සංස්ථාගත කිරීමට නොහැකි වී තිබුණි.

1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය වෙත 2016 ජනවාරි මාසයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 4,768,000 ක් වටිනා හයිබ්‍රිඩ් තාක්ෂණ උපකරණ සහ හයිබ්‍රිඩ් මෝටර් කාර් රථයක වටිනාකම් ගිණුම් ගත කර නොතිබුණු අතර වත්කම් ලේඛනයට ද ඇතුළත් කර නොතිබුණි. තවද ඒ සඳහා ගෙවන ලද රු. 353,835 ක් වූ රේගු හා ගුදම් ගාස්තු පුනරාවර්තන වියදමක් ලෙසට ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වන විට නිමකර නොතිබුණු කොන්ත්‍රාත් කාර්යයන් දෙකක් වෙනුවෙන් ගෙවන ලද එකතුව රු. 20,536,172 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත නොකර ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) ණයගැතියෝ | 3,958,817 | ණයගැති උපලේඛන, ශේෂ සනාථන |
| (ආ) අමතර කොටස්, ලිපිද්‍රව්‍ය හා තීන්ත | 7,255,216 | භෞතික සමීක්ෂණ වාර්තා |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2016 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු. 3,958,817 ක් වූ අතර ඉන් රු. 3,037,021 ක් එනම් සියයට 77 ක් වර්ෂ 3 ත් වර්ෂ 11 ත් අතර කාල පරිච්ඡේදයකට අයත් විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 10 හා 11 වගන්ති, 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය හා 2000 ජුනි 27 දිනැති අංක පීෆ්/පීඊ/9 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව ආයතනය විසින් ස්ථාවර තැන්පතු ලෙස රු. 23,929,269 ක් ද, භාණ්ඩාගාර තැන්පතු ලෙස රු. 8,850,137 ක් ද ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 756 | සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දින හෝ ඊට ආසන්න දිනයක භාණ්ඩ සමීක්ෂණය සිදු කල යුතු වුවද ආයතනය විසින් 2017 පෙබරවාරි 28 දින වන විටත් 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා සමීක්ෂණ මණ්ඩලය පත් කර හෝ නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 772 | 2015 වර්ෂයේ සිදු කළ භාණ්ඩ සමීක්ෂණයේ දී නුසුදුසු ලෙස හඳුනාගෙන තිබූ භාණ්ඩ ඒකක 111 ක් සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2017 ජුනි 10 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.5,833,292 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 48,910,721 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 54,744,013 ක වර්ධනයක් නිරීක්ෂණය විය. භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රදාන රු. 42,000,000 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඌනතාවය අඛණ්ඩව වැඩි වී තිබූ අතර 2016 වර්ෂයේදී අතිරික්තයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් හා රජයට ගෙවූ බදු නැවත ගැළපීමේදී 2012 වර්ෂයේදී රු. 139,798,634 ක් වූ දායකත්වය 2016 වර්ෂයේදී රු. 333,314,727 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දින වන විට ආයතනයට අයත් කටුබැද්ද පුහුණු මධ්‍යස්ථානයේ සහ බොරළැල්ල ශාඛාවේ සිසුන් 1896 ක් සහභාගී වන පාඨමාලා 12 ක් පවත්වමින් තිබුණි. දේශීයව හා ජාත්‍යන්තරව ඉහළ පිළිගැනීමක් ඇති මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ රැකියා අවස්ථාවන්ට ගැළපෙන ආකාරයේ වෘත්තීය පුහුණුවක් ලැබිය හැකි මෙම පාඨමාලා සඳහා වාර්ෂිකව අඛණ්ඩව වර්ධනය වන ඉල්ලුමක් පැවතුනත් ආයතනය විසින් එම ඉල්ලුමට සරිලන පරිදි පුහුණු ධාරිතාවය පුළුල් කර නොතිබුණි. ඒ අනුව පසුගිය වර්ෂ 5 තුළ පාඨමාලා සඳහා ඉල්ලුම් කළ සිසුන් 10,318 න් සිසුන් 7,752 ක් එනම් සියයට 75 කට පුහුණු අවස්ථා ලැබී නොතිබුණි. කෙසේ වුවද, ආයතනය විසින් මුදල් අයකිරීම මත ප්‍රතිතනය නොකරනු ලබන කෙටිකාලීන පාඨමාලා 38 ක් පවත්වා තිබුණු අතර 2012 වර්ෂයේ සිසුන් 2,802 ක් සහභාගී කර පැවැත්වූ මෙම පාඨමාලා සඳහා ශිෂ්‍ය සහභාගීත්වය 2016 වර්ෂය වන විට 3,943 ක් දක්වා වැඩිකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආයතනය විසින් පවත්වා තිබූ පාඨමාලා 12 න් සිසුන් 258 ක් සහභාගී වූ පාඨමාලා 04 ක් ප්‍රතිතනය කර නොතිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයුධ යන්ත්‍ර අංශය සඳහා විද්‍යාගාරයක් ඉදිකිරීම, ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සහ යන්ත්‍ර උපකරණ හා පිරියත මිලදී ගැනීම සඳහා එකතුව රු. මිලියන 48.6 ක් වෙන් කර තිබුණු අතර ඉන් රු. මිලියන 29.67 ක් වැයකර අදාළ කටයුතු ආරම්භ කර තිබුණි. කෙසේ වුවද සැලසුම්කළ පරිදි එම කාර්යයන් අවසන් කර නොතිබුණු අතර රු. මිලියන 18.93 ක ප්‍රතිපාදන ද ඉතිරි වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමිය ඇතුළුව ආයතනය විසින් දීර්ඝ කාලීනව භුක්ති විඳින රු.1,149,350,000 ක් වටිනා ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ අළුතින් ආරම්භ කරන ලද පාඨමාලා සඳහා රු. 1,663,270 ක් වටිනා පොත් ආයතනයට ලැබී තිබුණ ද පසුගිය වර්ෂ 04 තුළ අනෙකුත් පාඨමාලා සඳහා අවශ්‍ය පොත් මිලදී ගැනීම හා පුස්තකාල සංවර්ධනය සඳහා ආයතනය විසින් කිසිඳු මුදලක් වැයකර නොතිබුණි. මේ නිසා පූර්ණ කාලීන හා කෙටිකාලීන පාඨමාලා හදාරන සිසුන්ට යාවත්කාලීන වූ දැනුම ලබාගැනීමට ඇති අවකාශ අහිමි වී තිබුණි.

(ඇ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ ජර්නල් සටහන් 250 ක් යටතේ එකතුව රු. 3,312,825,751 ක ගනුදෙනු සටහන් කර තිබුණු අතර එම ජර්නල් සටහන් වලට අදාලව, විස්තර ඇතුළත් ජර්නල් වවුචර් පිළියෙල කර නොතිබීම, ඊට පාදක වූ තොරතුරු ගොනුගත කර නොතිබීම, විධිමත් නිර්දේශයකින් හා අනුමැතියකින් තොරව ජර්නල් සටහන් යොදා තිබීම වැනි අඩුපාඩු හේතුවෙන් එම සටහන් විධිමත් අනුමැතියක් මත නිවැරදිව සිදුකර ඇති බවට තහවුරු නොවුණි.

(ඇ) යන්ත්‍ර අංශයේ සහ එන්ජින් අංශයේ වහලය සෑදීම සඳහා කොන්ත්‍රාත්කරුවකු වෙත 2015 වසරේදී රු. 658,897 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර පිළිගත හැකි හේතුවකින් තොරව ආයතනය විසින් එම කොන්ත්‍රාත්තුව නවතා තිබුණි. නිම කරන ලද වැඩ කොටස්වල ප්‍රමාණය නිශ්චය කර අවශ්‍ය ගිණුම් සටහන් තැබීමෙන් හා කොන්ත්‍රාත්තුව නිම කිරීමට කටයුතු කිරීමෙන් තොරව ගෙවන ලද මුදල තවදුරටත් ස්ථාවර වත්කම් සඳහා අත්තිකාරම් මුදල් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ පාඨමාලා සඳහා සහභාගීවන අභ්‍යාසලාභීන් වෙනුවෙන් හදිසි අනතුරක දී වන්දි ගෙවීම සඳහා එක් අභ්‍යාස ලාභියකුගෙන් රු. 275 ක මුදලක් අයකර 1999 වර්ෂයේ දී ආධුනික රක්ෂණ යෝජනා ක්‍රමයක් ආරම්භ කර තිබුණු අතර 2016 වර්ෂය නිම වන විට එහි ශේෂය රු. 8,898,814 ක් වී තිබුණි. කෙසේ වුවද එම අරමුදල සඳහා දායකත්වය සපයන සිසුන්ට ප්‍රතිලාභ ලබාදිය හැකි විධිමත් වැඩපිළිවෙලක් සකස් නොකර අරමුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි වටිනාකම රු. 7,068,807 ක් වීතිබුණි.

(ආ) ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් ලෙස දක්වා ඇති රු. 6,425,019 ක වටිනාකම තුළ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් පැමිණි සේවකයින්ගෙන් අයකර තිබූ සේවක අර්ථ සාධක අරමුදල් සඳහා ලැබී තිබූ රු. 3,374,233 ක පොලී මුදලද, සේවකයින් 04 දෙනෙකු විසින් සේවක අර්ථ සාධක අරමුදල ඇපයට තබා ලබාගෙන තිබූ නිවාස ණය වෙනුවෙන් 2016 වර්ෂය දක්වා වැටුපෙන් කපාගත් එකතුව රු. 892,215 ක් ද ඇතුලත්වී තිබුණි. 2014 වර්ෂයේ සිට ඉහත කී ණය හා පොලී වටිනාකම අඩුකර ඉතිරි මුදල පමණක් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදල වෙත ගෙවා තිබුණු අතර ඉහත සඳහන් ණය වාරික සහ පොලී ආදායම නැවත සේවකයන් වෙත ගෙවීමට හෝ ඒ පිළිබඳ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

(ඇ) ආයතනය විසින් 2015 දෙසැම්බර් සිට නව සේවක අන්තර්ග්‍රහණය යටතේ වැටුප් වර්ධක සමඟ වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණද, ඒ සඳහා 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 19 ඡේදය ප්‍රකාරව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා නොතිබුණි. එබැවින් 2016 වර්ෂයේ සේවයෙන් ඉවත්ව ගිය නිළධාරීන් 05 දෙනෙකුගේ සේවක පාරිතෝෂික මුදල් ගණනය කිරීමේදී අන්තර්ග්‍රහණයේ දී ලබා දී තිබූ වැටුප් වර්ධක නොසලකා හැරීමට සිදුවී තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් නිෂ්පාදන තාක්ෂණවේදී පාඨමාලාව (Production Technology) ආරම්භ කිරීම සඳහා 2016 දෙසැම්බර් මස රු. 240,496,777 ක් වටිනා උපකරණ ලබා දී තිබුණ ද විගණිත දිනය වූ 2017 ජුනි 07 දින වන විටත් එම පාඨමාලාව ආරම්භ කර නොතිබීම හේතුවෙන් අදාල උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ආයතනයේ ආපන ශාලාවේ ප්‍රයෝජනය සඳහා රු. 328,324 ක් වැය කරමින් සකස් කරන ලද අර්ධ නිමි පුටුතොගයක් වැඩ අවසන් කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකර 2015 වර්ෂයේ සිට ආයතන පරිශ්‍රයේ ගොඩගසා තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 7,009,874 ක් වටිනා අමතර කොටස් තොගයෙන්, වටිනාකම රු. 69,309 ක් වූ අයිතම 9 කට අයත් ඒකක 308 ක් වර්ෂ 20 කට අධික කාලයක සිට ද, වටිනාකම රු. 137,640 ක් වූ අයිතම 69 කට අයත් ඒකක 5413 ක් වර්ෂ 10 ත් වර්ෂ 20 ත් අතර කාලයක සිට ද, වටිනාකම රු. 225,303 ක් වූ අයිතම 57 කට අයත් ඒකක 5,873 ක් වර්ෂ 02 ත් වර්ෂ 10 ත් අතර කාලයක සිට ද භාවිතයට ගෙන නොතිබුණි.

## 4.5 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ජනවාරි 20 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත වටිනාකම රු. 5,487,905 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් කාර්යයන් 3 ක් ප්‍රදානය කර තිබුණු අතර ඊට අදාල විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

**(i)** ඉහත කොන්ත්‍රාත් තුන අතරින් එකතුව රු. 4,109,411 ක් ගෙවා තිබූ සහ 2016 පෙබරවාරි 17 දිනට වැඩ නිම කළ යුතු කොන්ත්‍රාත් කාර්යයන් දෙකක් නියමිත පරිදි නිම නොකිරීම මත 2016 අගෝස්තු 23 දින අවලංගු කර තිබුණි. වැඩ නිම කරන ලද අනෙක් කොන්ත්‍රාත්තුව වූ ප්‍රධාන කොරිඩෝවේ වහලය හා පීලි අළුත්වැඩියා කිරීමේ කාර්යය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අනුව රු. 1,774,647 ක් ගෙවා තිබුණද, නියමිත ප්‍රමිතියට අනුව නිමකර නොතිබුණු බව තාක්ෂණ ඇගයීම් කමිටුවේ සාමාජික හා ආයතනයේ නඩත්තු කටයුතු භාරව සිටි නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු (වැඩ) ගෙන් ලබාගෙන තිබූ වාර්තාවකට අනුව තහවුරු වී තිබුණි.

**(ii)** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශයට පටහැනිව මෙම කොන්ත්‍රාත් කාර්යයන්වලට අදාලව ප්‍රතිග්‍රහණ ලිපි යැවීම කොන්ත්‍රාත් ප්‍රදානයෙන් දින 16 ක් ප්‍රමාද කර සහ ගිවිසුම් අත්සන් කිරීම කොන්ත්‍රාත් ප්‍රදානයෙන් දින 18 කට පසුව සිදුකර තිබුණි.

**(iii)** ගිවිසුම් ප්‍රකාරව 2016 අගෝස්තු 23 දින අවලංගු කරන ලද කොන්ත්‍රාත් දෙක නිම කර භාර දිය යුතුව තිබූ 2016 පෙබරවාරි 17 දින සිට ප්‍රමාද වූ දින 187 ක් සඳහා දිනකට ගිවිසගත් මුදලින් 1/4000 ක් බැගින් එකතුව රු. 292,658 ක ප්‍රමාද ගාස්තු අය කළ යුතුව තිබුණත් එසේ කර නොතිබුණි.

**(iv)** කොන්ත්‍රාත්වලට අදාල කාර්යසාධන ඇපකර 2017 ජනවාරි 11 දින දක්වා වලංගුව තිබුණද, ගිවිසුම් ගත කාලය තුළ නියමිත ප්‍රමිතියට අනුව වැඩ නිමකර නොතිබීමෙන් ආයතනයට වූ පාඩුව ආවරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(v)** කොන්ත්‍රාත් ගිවිසුම්වල 4 වන වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් ගෙවීම් වලින් සියයට 10 ක් රඳවාගැනීම් සිදුකල යුතු වුවත් එසේ කර නොතිබුණි.

(vi) අවලංගු කරන ලද වෙල්ඩින් අංශයේ පන්ති කාමර හා වහල අළුත්වැඩියා කිරීමේ කාර්යය සඳහා එකතුව රු. 1,310,915 ක් ගෙවා තිබුණත්, 2017 පෙබරවාරි 01 දින වන විට සහතික කළ වැඩ හා වැඩ බිමේ ඉතිරි ද්‍රව්‍ය වල වටිනාකම රු. 1,069,817 ක් පමණක් වූ බැවින් වැඩිපුර රු. 241,098 ක් ගෙවා ඇති බවත්, ප්‍රමාණ පත්‍රයේ සඳහන් කාර්යයන් 20 ක් අතුරින් වටිනාකම රු. 1,875,500 ක් වූ කාර්යයන් 12 ක් නිමකර නොමැති බවත්, නිම කරන ලද කොටස් නිසි ප්‍රමිතයකට අනුව ඉටුකර නොතිබුණු බවත්, ආයතනයේ නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරුවරයකු විසින් ලිඛිතව වාර්තා කර තිබුණි.

(ආ) ආයතනයේ වාර්ෂිකව වැඩිවන ශිෂ්‍යයන්ට නවාතැන් සපයාගැනීමේ ගැටළුවට විසඳුමක් ලෙස ශිෂ්‍යයන් 1000 කට නවාතැන් ගැනීමට හැකිවන ආකාරයේ නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා 2016 වාර්ෂික අයවැයෙන් රු. මිලියන 160 ක් වෙන්කර තිබුණත්, එම මුදල් උපයෝගී කරගෙන එම කාර්යය නිමකර නොතිබුණි. තවද 2017 වර්ෂයේ රේඛීය අමාත්‍යාංශයට ලැබී ඇති ප්‍රතිපාදන උපයෝගී කරගෙන මෙම කටයුත්ත කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එහෙත් විගණන දිනය වූ 2017 ජුනි 10 දින දක්වා මෙම කටයුත්ත ආරම්භ කර නොතිබුණි.

(ඇ) ඇස්තමේන්තුගත පිරිවැය රු. 583,000 ක්වූ ජල ටැංකි රඳවනයක් ඉදිකිරීම සඳහා 2013 නොවැම්බර් 15 දින පෞද්ගලික ආයතනයකට භාර දී 2014 සැප්තැම්බර් 25 දින වන විට එය නිමකර රු. 688,300 ක් ගෙවා තිබුණි. මූලික සැලසුම අනුව ලීටර් 5000 ටැංකි 02 ක් රඳවීමට මෙම ආධාරකය සකස් කලද වැඩ නිමකල පසු එහි ශක්තිමත් භාවය පිළිබඳ ඇති වී තිබූ ගැටලු හේතුවෙන් ලීටර් 2000 ජල ටැංකි දෙකක් පමණක් රඳවා තිබුණි. මේ නිසා ආයතනය සැලසුම් කළ ජල ටැංකි ධාරිතාවය සියයට 60 කින් ගබඩා කිරීමට නොහැකි වී තිබුණි. එමෙන්ම එහි ශක්තිමත්භාවය වැඩි කිරීම සඳහා නැවත ආධාරකයක් සකස් කිරීමට සිදුවී තිබුණු අතර ඒ තුළින් ආයතනයට තවත් රු. 133,632 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 05 දින නිම කිරීමේ එකඟතාවය මත රු. 7,015,575 ක ඇස්තමේන්තු මුදලකට පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත 2016 අගෝස්තු 03 දින යාන්ත්‍රණ අංශය සඳහා පංති කාමර හා පරීක්ෂණාගාරයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පවරා දී තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ලබාදී තිබූ කාර්යසාධන ඇපකරය 2017 අප්‍රේල් 03 දින අවසන්ව තිබුණු අතර විගණන දිනය වූ 2017 ජුනි 10 දින තෙක් මෙම ඉදිකිරීම නිම කර නොතිබුණ ද එහි කාලය දීර්ඝ කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 වගන්තියට පටහැනිව මෙම කොන්ත්‍රාත්තුවට අදාල ගිවිසුම අත්සන් කිරීම කොන්ත්‍රාත්තුව පිරිනමා දින 63 ක් ගතවීමෙන් පසුව සිදුකර තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලය නිළධාරීන් 268 දෙනෙකු වූ අතර සමාලෝචිත වර්ෂය නිමවන විට සේවක පුරප්පාඩු 15 ක් පැවතුණි. මෙම පුරප්පාඩු අතර ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා තීරණ ගැනීම කෙරෙහි ඍජු බලපෑමක් ඇතිවිය හැකි ලේඛකාධිකාරී තනතුර වර්ෂ 03 ක සිට පුරප්පාඩු වී පැවති අතර මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 12 ක්ද පුරප්පාඩු වී පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

2016 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ආයතනයේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 07 ක් සම්බන්ධයෙන් විගණන කටයුතු සිදුකිරීමට මිනිස් ශ්‍රම පැය 3,865 ක් යෙදවීමට සැලසුම් කර තිබුණි. එහෙත් වර්ෂය තුළ ඉන් වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ක්‍රියාත්මක කර තිබූ වැඩසටහන් 02 කට අදාලව විගණන විමසුම් 05 ක් නිකුත් කර තිබුණ ද ඒ සඳහා විගණන දිනය වූ 2017 ජුනි 10 දින තෙක් පිළිතුරු ලබා දී නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

ආයතනය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේ දී ප්‍රසම්පාදන අවශ්‍යතාවය නිශ්චිතව තීරණය කර විධිමත් පරිදි සකස් කර නොතිබුණු බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ එකතුව රු. 6,304,401,273 ක් වූ යන්ත්‍ර හා උපකරණ අවස්ථා 12 ක දී මිලදී ගැනීම.

(ආ) පුහුණු අවශ්‍යතා සඳහා ද්‍රව්‍ය මිලට ගැනීමේ දී එක් එක් අංශවල අවශ්‍යතා පුරෝකථනය කර ආයතනයට උපරිම වාසි සැලසෙන පරිදි වර්ගීකරණය කර කාණ්ඩ ලෙස මිලදී ගැනීම වෙනුවට 2016 වර්ෂය තුළ රු. 6,017,377 ක් වටිනා පුහුණු උපකරණ අවස්ථා 248 ක දී මිලදී ගැනීම.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

2016 වර්ෂය සඳහා වූ අයවැය ලේඛන ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර ඇති වී තිබූ විචලනයන් හේතුවෙන් ආයතනය විසින් අයවැය ගත කාලපරිච්ඡේදය අවසන් වූ පසුව එනම් 2017 පෙබරවාරි 20 දින සංශෝධිත අයවැය ඇස්තමේන්තුවක් සකස් කර උපදේශක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව ආයතනය විසින් සකස්කළ වාර්ෂික අයවැය ලේඛනය ඵලරහිත මෙන්ම මූල්‍ය පාලන උපාංගයක් ලෙස ඵලදායීව උපයෝගී කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

### 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

පසුගිය විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණු පහත සඳහන් අඩුපාඩු සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද නිවැරදි කර නොතිබුණි.

| ඡේදයට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| 2015 - 4.5 (අ) | ආයතනයේ නියෝජ්‍ය විදුහල්පති තනතුර සඳහා විධිමත් පත්වීමකින් හා අනුමැතියකින් තොරව වැඩ බැලීම් සිදුකළ නිලධාරියා වෙත 2014 ජුනි 30 දින සිට 2016 අගෝස්තු 30 දින දක්වා කාල පරිච්ඡේදය තුළ රු. 512,839 ක් ගෙවීම් කර තිබීම. |
| 2015 - 4.5 (ආ) | ආයතනයේ සේවයෙන් ඉල්ලා අස්වී පෞද්ගලික ආයතනයක සේවය කර තිබුණු නිලධාරියකු ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව අඛණ්ඩව සේවය කළ නිලධාරියකු ලෙස සලකා සේවය නොකළ කාලය සඳහා රු. 105,402 ක සම්පූර්ණ වැටුප් හා දීමනා හා අදාල වැටුප් පියවරයන් ද ලබා දී තිබීම. |

| | |
|---|---|
| 2015 - 5.1 | 2012 – 2016 සංයුක්ත සැලැස්මට අනුව ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට බාධාකාරී සාධක ලෙස හඳුනාගෙන තිබූ ප්‍රමාණවත් පුස්තකාල පහසුකම් නොමැතිවීම, දත්ත මූලාශ්‍රයක් හා තත්ත්ව කළමනාකරණ පද්ධතියක් නොමැතිවීම හා ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපනය නොකිරීම යන අඩුපාඩු නිවැරදි කිරීමට සැලසුම්ගත කාලය ඉක්මවා තිබියදීත් ආයතනයට නොහැකි වීම. |
| 2014 - 4.2 (අ) | වටිනාකම රු. 1,103,200 ක් වූ පරිගණක ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් රු. 591,100 ක් වැයකර තිබුණ ද එහි පැවති අඩුපාඩු හා දෝෂ හේතුවෙන් එම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබීම සහ ගිණුම් කටයුතු සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් ලබාදීමටද කටයුතු කර නොතිබීම. |

**6. පද්ධති හා පාලනයන්**

---------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මානව සම්පත් කළමනාකරණය | දීර්ඝ කාලයක සිට ඉහළ කළමනාකරණ මට්ටම්වල තනතුරු පුරප්පාඩු පිරවීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු නොවීම සහ සේවා ව්‍යවස්ථා හා අනුමත වැටුප් ව්‍යුහයන් සම්බන්ධ පැනනැගී ඇති ගැටළු නිරාකරණය නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | මූල්‍ය තොරතුරු නිවැරදිව වාර්තා වන පරිදි පරිගණක ගත විධිමත් ගිණුම්කරණ පද්ධතියක් පවත්වා නොගැනීම. |
| (ඇ) ණයගැති හා අයවිය යුතු ආදායම් පිළිබඳ පාලනය | වාර්තා නිසි පරිදි නඩත්තු කර අයවිය යුතු ආදායම් නියමිත කාලය තුළ අයකර නොගැනීම. |
| (ඈ) මෙහෙයුම් පාලනය | ආයතනය විසින් ක්‍රියාත්මක කරන පුහුණු වැඩසටහන් සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී අනාගත රැකියා අවස්ථාවන්ට ගැළපෙන පරිදි ඉහළ ගුණත්වයකින් සහ ප්‍රමාණාත්මක වර්ධනයකින් යුතුව පවත්වාගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු නොවීම සහ පාඨමාලා සඳහා සිසුන් බඳවාගන්නා ප්‍රමාණය වර්ධනය කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඉ) කොන්ත්‍රාත් පාලනය | ආයතනය විසින් සිවිල් වැඩ සඳහා වූ කොන්ත්‍රාත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව නිසි ප්‍රමිතියකින් හා සැලසුම් කළ කාල සීමාව තුළ නිමකර ගැනීම සඳහා කටයුතු නොකිරීම. |